[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/fy;tp mikr;R - gpupntdhf;fs; fy;tpg; gpupT

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

| 01 | S | I |
|---|---|---|

## 02 ශ්‍රේණිය

## (01) සිංහල

පැය දෙකයි.

**පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.

i. පොසොන් පොහොය අපට අගෙයි.
ii. අපි වවමු රට නගමු.
iii. කප්රුකක් වන් පොල් ගස.
iv. සිරිලක අසිරිය.
v. ස්වාභාවික පරිසරය රැකගනිමු.

(ලකුණු 25)

02. (අ). මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ **ස්වර අකුරු** පිළිවෙළින් ලියන්න. (ලකුණු 05)

(ආ). මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ ඇති **වර්ගාක්ෂර** පිළිවෙළින් ලියන්න. (ලකුණු 05)

(ඇ). මිශ්‍ර සිංහල අක්ෂර මාලාවේ ඇති **සඤ්ඤක** අකුරු නිවැරදිව ලියන්න. (ලකුණු 05)

03. (අ).හිස්තැනට අදාළ ව්‍යඤ්ජනාක්ෂරය හෝ ස්වරාක්ෂරය යොදා නැවත ලියන්න.

i. ක්+ ඒ = ...........
ii. ......... + ඓ = වෛ
iii. ක් + ........ = කෞ
iv. ත් +....... = තෘ
v. න් + ඉ = .........

(ලකුණු 05)

(ආ). පහත දැක්වෙන වචන අකාරාදි පිළිවෙළට නැවත පෙළ ගස්වා ලියන්න.

i. කොළඹ
ii. නාවලපිටිය
iii. ඇතුගල්පුර
iv. කළුතර
v. අත්තනගල්ල

(ලකුණු 05)

(ඇ). පහත සඳහන් වචන යුගලවලින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. නිශ්චිත/නිස්චිත
ii. පයෝධර/පයෝදර
iii. ධාරිතාව/දාරිතාව
iv. දිළිඳු/දිලිඳු
v. තෙගුණ/තෙගුන

(ලකුණු 05)

04. (අ). පහත සඳහන් පද අතරින් සර්ව නාම පද වෙන් කර ලියන්න.

පූසා, ඔහු, ගස, ඒක, ළමයා, හෙතෙම, ගුරුතුමා, නුඹ, රථය, හේ (ලකුණු 05)

(ආ). පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් නිපාත පද වෙන් කර ලියන්න.

ඉක්බිති රාහුල තෙරණුවෝ වනාහි දෙව්රම් වෙහෙර බලා වැඩම කළහ. (ලකුණු 05)

(ඇ). පහත සඳහන් පදවල උපසර්ග වෙන් කර ලියන්න.

පිළිතුරු, අවමංගල, ප්‍රමුදිතා, නිර්ලෝභී, දුදන (ලකුණු 05)

[ 2 වැනි පිටුව බලන්න]

05. (අ). පහත දැක්වෙන වාක්‍යයේ ඇති විධි ක්‍රියා පදය ලියන්න.

" ස්වාමීන් වහන්ස , දානයට වඩින්න " යැ යි දායකයා පැවසී ය.

(ලකුණු 05)

(ආ). සුදුසු කර්තෘ පද, ක්‍රියා පද යොදා පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i. ................ මල් පූජා කළෙමු.
ii .................. අවවාද දුන්නාය.
iii. ශිෂ්‍යයන් විසින් ගුරුවරු ................
iv. ළමයි ක්‍රීඩා .............
v. ...................ගමට ගියෙහි.

(ලකුණු 05)

(ඇ). පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

i. රජතුමාගේ උයන රතු කහ නිල් වර්ණ සහිත මල්වලින් පිරී තිබිණි
ii. ළමයි ඉක්මනින් ගමට ගිය හ
iii. වෛරයෙන් වෛරය නොසංසිඳේ යනු බුද්ධ වචනයකි
iv. නළඟන රැඟුමෙන් රජු සතුටින් පිනා ගියේය මහ හඬින් සිනාසුනේ ය
v. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන්න බොහෝ දෙනාගේ අදහසකි

(ලකුණු 05)

06. (අ). පහත දැක්වෙන ඡේදයේ ඉරි ඇඳි පද දෙකෙහි අර්ථය ලියන්න.

කුහුඹුවෝ මීයෙහි ගඳින් **<u>බිලයෙන්</u>** නික්ම මැණිකෙහි දිරා ගිය පරණ **<u>හුය</u>** කාගෙන පලස් හූ අග ඩැහැගෙන යටින් අදනාහු අනෙක් ඇලයෙන් පිටත්කොට පීහ.

(ලකුණු 05)

(ආ). සුභාෂිතය කාව්‍ය සංග්‍රහයේ නියමිත කොටසින් ඔබ කැමති කවි දෙකක් නිවැරදිව ලියන්න.

(ලකුණු 10)

07. (අ). ගණදෙවි හැල්ල කෘතියෙහි දැක්වෙන පහත සඳහන් කවිය සම්පූර්ණ කර ලියන්න.

'සුරිඳු රජ විලසි නා'

(ලකුණු 05)

(ආ). **වදන් කවි පොතෙහි** දැක්වෙන පහත සඳහන් කවි දෙක සම්පූර්ණ කර ලියන්න.

"ස්වස්ති විභූෂණ කමලා වදනින්''
"වේවැල් කෝටු නාරං සියඹලා අතු"

(ලකුණු 10)

08. (අ). අඹ යහළුවෝ නවකතාවේ රචකයා නම් කරන්න.

(ලකුණු 05)

(ආ). දුප්පත් පොහොසත් භේදයෙන් තොරව මිතුරන් ඇසුරු කිරීම සුදුසු බව '**අඹ යහළුවෝ**' නවකතාවෙන් උගන්වන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

* * *